**නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව - 2020**

**-------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය තුළ පෙර වර්ෂය සඳහා වන ගැලපීම් ලෙස රු.5,291,994ක් ගලපා තිබුණු නමුත් එම වටිනාකමෙහි ස්වභාවය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී ශුද්ධ වත්කම් වෙනස්වීම් මූල්‍ය ප්‍රකාශනවල විශේෂිත හෙළිදරව් කිරීම් යටතේ පෙන්වීමට කටයුතු කරමි. | වටිනාකමෙහි ස්වභාවය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කෙරෙන සියළුම සංඛ්‍යාත්මක තොරතුරු සඳහා පසුගිය කාලපරිච්ඡේදයේ සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කළ යුතුය. එසේ වුවද ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශයේ ඇතුලත් වටිනාකම් සහ දේපළ පිරියත උපකරණ සටහනට අදාළ එකතු කිරීම් සහ ඉවත් කිරීම් ඇතුළු වටිනාකම් සඳහා සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී එම තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | පසුගිය කාල පරිච්ඡේදයේ සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | සභාවේ හිඟ කුලී, පොදු ඉඩම්, ව්‍යාපාර බදු, අගරු චෙක්පත් සහ වෙනත් වැඩසටහන් සම්බන්ධයෙන් නඩු කටයුතු ආරම්භ කර ඇතත් ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී එම තොරතුරු විශේෂිත හෙළිදරව් කිරීම් යටතේ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව විගණනය වෙත කාරුණිකව දැනුම් දෙමි. | ආරම්භ කර ඇති නඩු කටයුතු පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයේදී එකතු කල අගය මත බදු ගිණුමේ (Vat) රු.5,009,985ක හර ශේෂයක් පැවති අතර ශේෂය පිළිබඳව ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් මෙම වටිනාකම පිළිබඳ තහවුරුවක් ලබාගෙන හෝ විමසීමක් සිදු නොකර හිලව් කිරීමට ඉඩ නොදුන් වැට් ගිණුමේ ශේෂය ලෙස අදාල වටිනාකම ජර්නල් සටහනක් මඟින් සමුච්චිත අරමුදලට හර කර තිබුණි. | ඉදිරියේදී විමසීමක් සිදු කර ලබා දෙන පිළිතුර අනුව කටයුතු කිරීමට පියවර ගන්නා බව දන්වා සිටිමි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | ප්‍රාදේශීය සභාව විසින් දීර්ඝකාලීනව භුක්ති විඳිනු ලබන ස්ථාවර වත්කම් ලේඛනය තුල ඇති අක්කර 10 පර්චස් 07ක ප්‍රමාණයක් වූ ඉඩම් 10ක් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | ඉඩම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වා සිටිමි. | ඉඩම්වල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර තිබුණු එකතුව රු.48,000,000ක් වූ ඉඩම් අක්කර 02 ක ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ඉඩම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඈ) | 2020 වර්ෂයේ සභාව විසින් මිලදී ගෙන තිබුණු එකතු වටිනාකම රු.746,571ක් වූ වත්කම්, ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කරන බව දැනුම් දෙමි. | සියළු ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඉ) | 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමියන් ලෙස දක්වා තිබූ සමාලෝචිත වර්ෂයේ ගබඩාවට ලැබී තිබුණු එකතු වටිනාකම රු.1,749,320ක් වූ වත්කම් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | මෙම වත්කම් සඳහා ගෙවීම් සිදු කරනු ලැබුයේ 2021 වර්ෂයේ බැවින් එම වත්කම් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදි ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගත කරන බව දැනුම් දෙමි. | 2020 දෙසැම්බර් 31 දින වන විට ගබඩාවට වත්කම් ලැබී තිබූ බැවින් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | ප්‍රාදේශීය සභා නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ නව කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා දරන ලද රු.33,837,329 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වැය වී ඇති මුදල ප්‍රාග්ධනිත කිරීමට කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | 2020 දෙසැම්බර් 31 දිනට වැය වී ඇති සියළු වියදම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (උ) | 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු වටිනාකම රු.14,726,722ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | ගිණුම් සකස් කරන අවස්ථාවේදී පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙන් මුදල සටහන් කරන ලද පිටපත නොලැබී තිබූ අතර, 2021.02.03 දින එම පිටපත ලැබූ හෙයින් ගිණුම් වලට ගලපා ඇත්තේ රු.7,229,713ක වටිනාකමක් පමණක් බව දන්වා සිටිමි. | නිවැරදි වටිනාකම ගිණුම් ගත කළ යුතුවේ. |

**1.7** අනුකූල නොවීම්

**-------------------**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

**--------------------------------------------------------------------------------**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| 2004 ඔක්තෝබර් 11 දිනැති හා අයවැය චක්‍රලේඛ අංක 118 හි 1.1 වගන්තිය | ස්ථාන මාරු වී ගිය සේවකයින් 05 දෙනෙකුගෙන් සේවක ණය ලෙස රු. 361,630 ක ණය ශේෂයක් අයවිය යුතුව තිබුණි. | හිඟ ණය ශේෂ කඩිනමින් අය කර ගැනීමට කටයුතු කරමි. | අයවිය යුතු සේවක ණය ශේෂ කඩිනමින් අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. |

**2.** මූල්‍ය සමාලෝචනය

**---------------------**

**2.1** මූල්‍ය ප්‍රතිඵල

**---------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.106,000,263ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.135,454,187ක් විය.

**2.2** ආදායම් පරිපාලනය

**----------------------**

**2.2.1** ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

**-----------------------------------------**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා අක්කර බදු** | | |
| | හිඟ වරිපනම් හා අක්කර බදු ශේෂය වූ රු.13,244,323 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කොරෝනා වසංගතය නිසා වර්ෂය පුරාම ආදායම් රැස් කිරීමට බාධා එල්ල වූ බැවින් ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය පහත වැටී ඇති බව දන්වා සිටිමි. | වර්ෂය තුල බිල්කළ ආදායම් වර්ෂය තුලදීම අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

(ආ) **කුලී**

------

| | | |
|---|---|---|
| හිඟ කඩ කුලී හා බදු කුලී ශේෂය වූ රු.1,030,102 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. | වර්ෂය තුල බිල්කළ කඩ කුලී වර්ෂය තුලදීම අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

(ඇ) **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් මුද්දර ගාස්තු ලෙස රු.110,000,000 ක් ලැබිය යුතු වුවත් එය අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. | සමාලෝචිත වර්ෂයට අදාළ සියළු දඩ මුදල් හා මුද්දර ගාස්තු යාවත්කාලීනව හඳුනාගෙන අයකර ගත යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

ප්‍රාදේශීය සභා පනත 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 අනාර්ථික ගනුදෙනු

----------------------

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| හෙක්ටයාර 2.04ක් වූ මාවිල කීනකැලේවත්ත සම්පූර්ණ ඉඩම හෙක්ටයාර් එකකට අඩුවන සේ පිඹුරුපත් 02ක් ලෙස අනු බෙදුම් කර පුද්ගලික වෙන්දේසි සමාගමක් විසින් 2019 ඔක්තෝබර් 26 දින මිලදී ගෙන ඉඩම් අනු බෙදීම සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ගෙන් අනුමැතිය 2020 මාර්තු 12 දින ලබාගෙන තිබුණි. සම්පූර්ණ ඉඩම අනුබෙදීම් කිරිම සඳහා පිඹුරුපත් 02ක් ඉදිරිපත් කිරීම අදාළ නීතිරීති වලින් ගැලවී යාමට කල උත්සාහයක් බවත් ඒ හේතුවෙන් ඉඩමෙන් පොදු පහසුකම් සඳහා හිමිවිය යුතු පර්චස් 64ක පමණ බිම් කොටස් සභාවට අහිමි වී තිබුණි. | මෙම ඉඩමෙන් පොදු පහසුකම් සඳහා ඉඩම් කොටසක් වෙන් කර ගැනීමට නාගරික සංවර්ධන අධිකාරියෙන් උපදෙස් ඉල්ලා සිටි නමුත් පොදු කටයුතු සඳහා ඉඩම් වෙන් කිරීමක් අවශ්‍ය නොවන බව එම ආයතනයෙන් උපදෙස් ලැබී තිබුණි. | ඉඩම් අනුබෙදුම් කිරීමට අදාළ නීති රීති අනුව කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 -2020 කාලය තුල වෙනත් රාජ්‍ය ආයතන සහ පෞද්ගලික ආයතන වෙතින් තරග ජයග්‍රහණ හා සේවක උපහාර වැනි කටයුතු සඳහා ලබා දුන් රු.360,338 ක් එම කටයුතු සඳහා උපයෝජනය නොකොට මිශ්‍ර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | එම තැන්පත් අතරින් නිදහස් කළ හැකි තැන්පත් නිදහස් කිරීමටත් ඉතිරි තැන්පත් ආදායමට ගැනීමටත් ක්‍රියා කරන බව දන්වා සිටිමි. | තැන්පත් මුදල් නිදහස් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාරවිල සතිපොල හා නාත්තන්ඩිය සති පොල සඳහා බදු ගිවිසුම්ගත වීමේදී ජල ගාස්තුව හා විදුලි ගාස්තුව බදුකරු විසින් ගෙවිය යුතු බවට කොන්දේසියක් ඇතුළත් කර නොතිබූ බැවින් 2020 වර්ෂයේ ජල බිල්පත් හා විදුලි බිල්පත් සඳහා පිළිවෙලින් රු.141,972ක් හා රු.155,256ක් සභා අරමුදල මඟින් ගෙවා තිබුණි. | එවැනි කොන්දේසියක් අදාළ ගිවිසුම් වලට ඇතුලත් කර නොතිබූ අතර, ඉදිරියේදී එම දේපළ වලට අදාළ බදු ගිවිසුම් සඳහා මෙම කොන්දේසිය ඇතුලත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | ගිවිසුම්ගත වීමේදී අදාළ කොන්දේසි ඇතුළත් කර ගිවිසුම්ගත විය යුතුවේ. |
| (ආ) | සභාවේ තොග පාලන කටයුතු සඳහා 2015 වර්ෂයේ රු.150,000ක් වැයකර තොග පාලන මෘදුකාංගයක් 2015 ඔක්තෝබර් 12 දින ස්ථාපිත කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ කටයුත්ත සඳහා මෘදුකාංගය භාවිතා කර නොතිබුණි. | තොග පාලන මෘදුකාංගය වෙනුවෙන් ගෙවූ රු.150,000ක මුදල අඩු කර ඉතිරි මුදල් ගෙවීමට කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | තොග පාලන මෘදුකාංගය සඳහා ගෙවූ මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉහළ කටුනේරිය බෝගහලන්ද ඉඩම වෙනුවෙන් සියයට 10 ක පොදු ඉඩම් කට්ටි ප්‍රමාණයක් භෞතිකව වෙන් කළ යුතු බව නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් නිලධාරී හා නාගරික සංවර්ධන අධිකාරියේ පුත්තලම දිස්ත්‍රික් සැලසුම් කමිටුව විසින් දක්වා තිබුණු නමුත්, ප්‍රාදේශීය සභාව එය නොසළකා මෙම ඉඩම මිනුම් වටිනාකමින් සියයට 10 ක ප්‍රමාණයේ වෙළඳ වටිනාකම මුදලින් ලබා ගැනීමට නිර්දේශ කර තිබුණි. | නාගරික සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කමිටුවට ඉදිරිපත් කර ලැබෙන උපදෙස් අනුව ක්‍රියා කරන බව දන්වා සිටිමි. | ඉඩම් අනුබෙදුම් කිරීමට අදාළ නීති රීති අනුව කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කොස්වාඩිය මාරගේනයා අගාරේ වෙන්දේසි ඉඩමේ අනු බෙදුමෙන් රූඩ් 01 පර්චස් 4.30ක් ප්‍රාදේශීය සභාවට ලබාදී තිබුණු අතර 2021 ජනවාරි 13 දින විගණන පරීක්ෂණ අවස්ථාව වන විට අනු බෙදුම වෙනස් කර තිබුණි. එහිදී ප්‍රාදේශීය සභා පොදු ඉඩම හරහා තිබුණු මීටර් 4.5ක් පළල පාර දීර්ඝ කර තිබුණු බව දක්නට ලැබුණි. 2019 මාර්තු 29 දින අනු බෙදුම් පිඹුරුපත අනුමත කර තිබුණද විගණන අවස්ථාව වන විටත් අනුකූලතා සහතික ලබා නොතිබුණි. තවද මෙම ඉඩම සඳහා සියයට 1ක බද්ද ලෙස රු.194,620ක් අයකරගෙන තිබුණද අලෙවි වටිනාකම් පිළිබඳ විස්තර වෙන්දේසිකරු විසින් ඉදිරිපත් කර නොතිබුණි. | මෙම ඉඩමේ බස්නාහිර දිශාවට පිහිටි ඉඩමට ගමන් කිරීම සඳහා ප්‍රාදේශීය සභා පොදු ඉඩම හරහා තිබෙන පාර දීර්ඝ කර ඇති අතර, අනුකූලතා සහතිකය ලබා ගන්නා ලෙසත් විකුණුම් වාර්තා ඉදිරිපත් කරන ලෙසත් අදාල අයවළුන් වෙත දන්වා ඇත. | ඉඩම් අනුබෙදුම් කිරීමට අදාළ නීති රීති අනුව කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | 1996 අගෝස්තු 06 දිනැති අංක 935/6 ගැසට් පත්‍රයේ 22(1)(ඇ) අනුව පොදු කටයුතු සඳහා වෙන් කරන භූමි ප්‍රමාණය පර්චස් 20ට අඩු නම් එහි වෙළඳ අගය අයකර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවත්, එසේ නොගෙන මහවැව විලේජ් ඉඩම කොටස් කිරීමේදී ප්‍රාදේශීය සභාවේ ආදායම් පරීක්ෂකගේ වාර්තාවට අනුව සභාවට හිමි පර්චස් 15.3ක ප්‍රමාණයක් සභාවට හිමි බව දන්වමින් එහි වෙළඳ වටිනාකම රු.449,500ක් මුලා ලදුපතකින් සභා ආදායමට ගෙන තිබුණි. | ඉදිරියේදී නාගරික සංවර්ධන අධිකාරියේ උපදෙස් ලබාගෙන කටයුතු කරන බව දන්වා සිටිමි. | ඉඩම් අනුබෙදුම් කිරීමට අදාළ නීති රීති අනුව කටයුතු කළ යුතුවේ. |